# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2320/46 - 2023 පෙබරවාරි මස 22 වැනි බදාදා - 2023.02.22

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

## I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

### රජයේ නිවේදන

**1969 අංක 1 දරන ආනයන හා අපනයන (පාලන) පනත**

1985 අංක 48 දරන සහ 1987 අංක 28 දරන පනත් මඟින් සංශෝධිත 1969 අංක 1 දරන ආනයන හා අපනයන (පාලන) පනතේ 4 වන වගන්තියේ (1) වන උපවගන්තිය සහ 14 වන වගන්තිය සමඟ කියවිය යුතු, 20 වන වගන්තිය යටතේ, මුදල්, ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍ය රනිල් වික්‍රමසිංහ වන මවිසින් පනවනු ලබන රෙගුලාසි.

**රනිල් වික්‍රමසිංහ,**
මුදල්, ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍ය.

2023 පෙබරවාරි මස 22 වැනි දින,
කොළඹ 01,
මුදල්, ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශයේ දී ය.

**රෙගුලාසි**

1. මෙම රෙගුලාසි **"2023 අංක 04 දරන ගෙවීම් ක්‍රම සඳහා වූ ආනයන හා අපනයන පාලන රෙගුලාසි"** ලෙස හඳුන්වනු ලැබේ.

2. 2022 අංක 10 දරන ගෙවීම් ක්‍රම සඳහා වූ ආනයන පාලන රෙගුලාසි මඟින් සහ 2022 අංක 12 දරන ආනයන හා අපනයන (පාලන) රෙගුලාසි මඟින් පසුව සංශෝධනය කරන ලද, 2022 මැයි මස 06 දිනැති අංක 2278/21 දරන *අතිවිශෙෂ ගැසට් පත්‍රයේ* ප්‍රකාශයට පත් කරන ලද 2022 අංක 07 දරන ගෙවීම් ක්‍රම සඳහා වූ ආනයන පාලන රෙගුලාසි, මෙයින් තවදුරටත් පහත පරිදි සංශෝධනය කෙරේ.

3. 2022 ජූනි මස 24 දිනැති අංක 2285/19 දරන *අතිවිශෙෂ ගැසට් පත්‍රයේ* ප්‍රකාශයට පත් කරන ලද, 2022 අංක 10 දරන ගෙවීම් ක්‍රම සඳහා වූ ආනයන පාලන රෙගුලාසිවල අංක 4(ඈ) රෙගුලාසියට වහාම පසුව, පහත පරිදි කියවිය යුතු අංක 4(ඊ) රෙගුලාසිය මෙයින් ඇතුළත් කරනු ලැබේ.

1A - PG 6252 — 376 (2023/02)
*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

"4(ඊ) නිශ්චිත පර්යන්ත සේවා සැපයීම සඳහා ශ්‍රී ලංකාවේ ඕනෑම වරායක/ගුවන් තොටුපළක පිහිටි තම පර්යන්ත නඩත්තු කිරීමට සහ ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය වන භාණ්ඩ ආනයනය සඳහා තමන් විසින් උපයන විදේශ විනිමය වලින් ගෙවීම් පියවීම සිදු කරන පර්යන්ත ක්‍රියාකරුවන්.

පර්යන්ත ක්‍රියාකරුවන් විසින් එවැනි භාණ්ඩ ශ්‍රී ලංකාවේ ඕනෑම වරායකට/ගුවන් තොටුපළකට එම භාණ්ඩ ළඟාවීමේ දී හෝ ඊට පෙර ලබා ගන්නා ලද වරාය විෂය භාර අමාත්‍යාංශ ලේකම්වරයාගේ පූර්ව නිර්දේශය මත ආනයනය කරනු ලැබිය යුතුය. "

4. 2022 අගෝස්තු මස 23 දිනැති අංක 2294/29 දරන *අතිවිශෙෂ ගැසට් පත්‍රයේ* ප්‍රකාශයට පත් කරන ලද 2022 අංක 12 දරන ආනයන හා අපනයන (පාලන) රෙගුලාසිවල අංක 5 (i) රෙගුලාසිය ඉවත්කර පහත පරිදි කියවිය යුතු නව රෙගුලාසි අංක 5 (i) මගින් ප්‍රතිස්ථාපනය කරනු ලැබේ.

"5 (i) පසුව සංශෝධනය කරන ලද 2022 අංක 07 දරන ගෙවීම් ක්‍රම සඳහා වූ ආනයන පාලන රෙගුලාසි යටතේ, ඕනෑම රාජ්‍ය ආයතනයක් විසින් හෝ ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය විසින් අනුමත කරන ලද ඕනෑම සංවර්ධන ව්‍යාපෘතියක් විසින් හෝ ඕනෑම රාජ්‍ය ආයතනයක් විසින් ප්‍රදානය කරන ලැබූ සංවර්ධන ව්‍යාපෘතියක් විසින් සෘජු භාවිතය සඳහා පමණක් සිදු කරන ලද පූර්ව අනුමැතියක් සඳහා වන ඉල්ලීමක්, ආනයන හා අපනයන පාලන දෙපාර්තමේන්තුවේ පාලක ජනරාල් විසින්;

(අ) එම භාණ්ඩ ශ්‍රී ලංකාවේ ඕනෑම වරායකට/ගුවන්තොටුපළකට පැමිණීමට පෙර ලබාගන්නා ලද, වාරිමාර්ග හෝ විදුලිබල හෝ ජලය හෝ මාර්ග සංවර්ධන විෂය භාර අමාත්‍යාංශ ලේකම්වරයාගේ නිර්දේශය මත අවස්ථානුකූලව සලකා බැලිය හැකිය.

ආ) ඉහත (අ) හි නිශ්චිතව දක්වා ඇති විෂයයන් හැර අනෙකුත් සියලුම අවස්ථාවන්හි දී, එම භාණ්ඩ ශ්‍රී ලංකාවේ ඕනෑම වරායකට/ගුවන්තොටුපළකට පැමිණීමට පෙර ලබාගන්නා ලද, භාණ්ඩාගාර ලේකම්වරයාගේ නිර්දේශය මත අවස්ථානුකූලව සලකා බැලිය හැකිය."

5. මෙම රෙගුලාසි ඵලදායී ලෙස ක්‍රියාත්මක කිරීම සඳහා ආනයන හා අපනයන පාලන දෙපාර්තමේන්තුවේ පාලක ජනරාල් විසින් ශ්‍රී ලංකා රේගු අධ්‍යක්ෂ ජනරාල් වෙත සහ බලපත්‍රලාභී බැංකු වෙත සුදුසු "මෙහෙයුම් උපදෙස්" නිකුත් කළ යුතුය.

6. ඉහතින් සංශෝධනය කරන ලද 2022 අගෝස්තු මස 23 දිනැති අංක 2294/29 දරන *අතිවිශෙෂ ගැසට් පත්‍රයේ* අංක 5 (i) රෙගුලාසිය උල්ලංඝනය කරමින් සිදු කරන ලද ඕනෑම ආනයනයක් සම්බන්ධයෙන් ශ්‍රී ලංකා රේගු අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් ආනයන හා අපනයන පාලන දෙපාර්තමේන්තුවේ පාලක ජනරාල්වරයාගෙන් උපදෙස් ලබා ගත යුතුය.

EOG 03 - 0084

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.